## පළමුවන දේව ප්‍රකාශනය

ක්‍රියා 2:1-11

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් උපුටා ගත් කොටසකි.

**සියල්ලෝ ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වී අන්‍ය භාෂාවලින් කථා කරන්නට වන්හ.**

තවද පෙන්තකොස්ත දිනය පැමිණි කල, ඔව්හු සියල්ලෝ එක් තැනෙක රැස්ව සිටියාහ. එකල, සැඩ සුළඟක් හමන්නාක් වැනි හඬක් හදිසියෙන් අහසින් නික්මුණේ ය. ඔවුන් හිඳගෙන සිටි ගෙය මුළුමනින් ම එයින් පිරී ගියේ ය. ගිනි දලු වැනි දිව් බෙදී ගොස් ඔවුන් එකිනෙකා මත පිහිටනු ඔවුන්ට පෙනිණි. ඔව්හු සියල්ලෝම ශුද්ධාත්මයාණන් ගෙන් පූර්ණ වී ආත්මයාණන් ඔවුන්ට දුන් කතා ශක්තිය ලෙස අන්‍ය භාෂාවලින් කතා කරන්නට පටන් ගත්හ. එකල මිහි පිට හැම රටකින් ම පැමිණි බැතිමත් ජුදෙව්වරු ජෙරුසලමෙහි සිටියෝ ය. මේ ශබ්දය ඇසුණු කෙණෙහි ම සමූහයා එක්රැස් වූ හ. එම කතා ඔවුන් එකිනෙකාට තම තමන්ගේ මවු බසින් තේරුම් ගත හැකි ලෙස ඇසුණෙන් ඔව්හු වික්ෂිප්ත වූහ. ඔව්හු සියල්ලෝ පුදුමයෙන් පුදුමයට පත්ව, "බලන්න, මේ කතා කරන සියල්ලෝ ගලීලයෝ නොවෙත් ද? අපට හුරු පුරුදු අපේම මවු බසින් ඔවුන් කතා කරනු එකිනෙකාට ඇසෙන්නේ කෙසේද? පාතිවරුන් ද මේදවරුන් ද එලාම්වරුන් ද මෙසපොතේමියාවෙහිත් ජුදය සහ කපදේකියෙහිත්, පොන්තසය සහ ආසියාවෙහිත්, පිරිගිය හා පම්පිලියායෙහිත්, මිසරය සහ සිරේනිය අවට ලිබියේ ප්‍රදේශවලත් යන මෙකී දේශවාසීන් ද රෝමයෙන් පැමිණි අමුත්තන් වන ජුදෙව්වරුන් හා ජුදෙව් ආගම වැළඳගත්තවුන් ද ක්‍රීතවරුන් හා අරාබිවරුන් ද වන අපි, අපේ ම භාෂාවලින් දෙවියන් වහන්සේගේ බලවත් ක්‍රියා ගැන ඔවුන් කතා කරනු අසම්හ." යි කීහ.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්ත්‍රෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 104:1,24,29-31,34

පිළිතුර: අහෝ සමිඳුනි, ඔබ වහන්සේගේ ස්ප්‍රීතුව එවා පොළෝ තලය අළුත් කළ මැනව.

ගීය: මාගේ සිත සමිඳුන් පසසන්න. මාගේ දෙවි සමිඳුනි, ඔබ ඉතා උතුම්ය. ඔබ තෙද මහිමයෙන් සැරසී සිටින සේක. සමිඳුනි, ඔබේ කර්මාන්ත කොපමණ විවිධාකාරද? ඔබ සියල්ල ප්‍රඥාවෙන් මැවූ සේක.

පොළොව ඔබ මැවූ සතුන්ගෙන් පිරී ඇත. ඔබේ මුහුණ ඔබ සඟවන කල උන් කැළඹෙති. ඔබ උන්ගේ හුස්ම පැහැරගන්න කල උන් නැසී දූවිලි බවට හැරී යති. එහෙත් ඔබ උන්ට හුස්ම දෙන කල උන් යළිත් මවනු ලබති. ඔබ පොළෝ තලයට නව දිවියක් දෙන සේක.

සමිඳුන්ගේ මහිමය සදහට ම පවතීවා! සමිඳාණෝ තමන් මැවූ සියල්ල ගැන සතුටු වෙත්වා! මාගේ භාවනාව සමිඳුන්ට ප්‍රසන්න වේවා! මන්ද, මාගේ ප්‍රීතිය එන්නේ එතුමන්ගෙන්ය.

## දෙවන දේව ප්‍රකාශනය

1 කොරින්ති 12:3-7,12-13

පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**එකම ආත්මයාණන් තුල එකම ශරීරයක් වන ලෙස ප්‍රසාද ස්නාපනය ලැබීමු.**

එබැවින් දේවාත්මයාණන් කරණකොට ගෙන කතා කරන කිසිවකු "ජේසුස් වහන්සේ ශාපලත් කෙනෙකැ"යි නොකියන බවද, ශුද්ධාත්මයාණන් කරනකොටගෙන මිස "ජේසුස් වහන්සේ සමිඳාණන් වහන්සේ ය."යි කීමට කිසිවකුට නොහැකි බව ද මම ඔබට තරයේ කියා සිටිමි. විවිධාකාර දීමනා ඇතත්, සිටින්නේ එකම ශුද්ධාත්මයාණෝ ය. විවිධාකාර සේවා ඇතත්, සිටින්නේ එකම සමිඳාණන් වහන්සේ ය. විවිධාකාර දේව බල ක්‍රියා කරතත්, සිටින්නේ සියල්ලන් තුල ක්‍රියා කරන එකම දෙවියන් වහන්සේ ය. අන්‍යොන්‍ය යහපත සඳහා එකිනෙකාට ආත්මයාණන්ගේ ප්‍රකාශවීමක් දී ඇත. මනුෂ්‍ය ශරීරයෙහි බොහෝ අවයව තිබුනත් ඒ අවයව විවිධාකාර වූවත් ඒ සියල්ල ම එකම ශරීරයක් වන්නාක් මෙන් ක්‍රිස්තුස් වහන්සේත් එකම ශරීරයක් වන සේක. මන්ද, ජුදෙව්වරුන් හෝ ග්‍රීකයන් හෝ වේවා! වහලුන් හෝ නිදහස් අය හෝ වේවා! අපි සියල්ලෝ ම, එකම ආත්මයාණන් තුල එකම ශරීරයක් වන ලෙස බෞතිස්ම-ස්නාපනය ලැබීමු. අපි සියල්ලෝ ම, එකම ආත්මයාණන්ගෙන් පානය කර සිටිමු.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
ශුද්ධාත්මයාණෙනි, වැඩමකර ඔබගේ විශ්වාසිකයන්ගේ හෘදයන් පිරෙව්ව මැනව,
ඔබගේ ප්‍රේමයේ ගින්න ඔවුන් තුළ දල්වුව මැනව.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ජොහන් 20:19-23

ජොහන් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**"පියාණන් වහන්සේ මා එවා වදාළාක් මෙන් මම ද ඔබ යවමි. ශුද්ධාත්මයාණන් පිළිගන්න."**

සතියේ පළමු වනදා වූ එදා සවස ජුදෙව්වරුන්ට බියෙන් ශ්‍රාවකයන් දොරවල් වසාගෙන සිටි තැනට ජේසුස් වහන්සේ වැඩම කර ඔවුන් මැද සිට, "ඔබට ශාන්තිය වේවා!" යි වදාළ සේක. උන්වහන්සේ මෙසේ වදාරා තමන් අත් ද ඇලය ද ඔවුන්ට පෙන්වූ සේක. ශ්‍රාවකයෝ සමිඳාණන් වහන්සේ දුටු කල ප්‍රීතියෙන් පිනාගියහ. "ඔබට ශාන්තිය වේවා!" යි යළිත් උන්වහන්සේ ඔවුන්ට වදාරා "පියාණන් වහන්සේ මා එවා වදාළාක් මෙන් මම ද ඔබ යවමි." යි ඔවුන්ට කී සේක. උන්වහන්සේ ඉක්බිති ඔවුන් පිට හුස්ම හෙළා, "ශුද්ධාත්මයාණන් පිළිගන්න. ඔබ යමෙකුගේ පව් කමා කරන්නහු ද, ඒවා ඔවුන්ට කමා කරනු ලැබේ. ඔබ යමෙකුගේ පව් කමා නොකරන්නහු ද, ඒවා කමා නොකරනු ලැබේය." යි ඔවුන්ට වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.